**ශීර්ෂය 261 - ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 261- ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජූලි 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

----------------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,120.30 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,084.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 35.3 ක් හෙවත් සියයට 3.15 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 1,042.30 | 1,037.71 | 4.59 | 0.44 |
| මූලධන | 78.00 | 47.28 | 30.72 | 39.38 |
| **එකතුව** | **1,120.30** | **1,084.99** | **35.31** | **3.15** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 32 ක් හා දෙපාර්තමේන්තු 18 ක් විසින් එකතුව රු.මිලියන 4,022 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 3,699 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සලසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 323 ක් හෙවත් සියයට 8.03 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 26101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 65.72 | 64.80 | 55.72 | 60.65 | 225.00 | 204.99 |

## 2.3 අග්‍රිම ගිණුම්

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ අග්‍රිම ගිණුමේ අංක 7002/0000/00/0308/0014/000 යටතේ 2015 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂය රු.මිලියන 0.19 ක් විය.

## 2.4 පොදු තැන්පත් ගිණුම්

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 05 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 422.30 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2015 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0094/000 | 0.05 |
| 6000/0000/00/0013/0062/000 | 22.40 |
| 6000/0000/00/0014/0009/000 | 0.00 |
| 6000/0000/00/0016/0045/000 | 328.51 |
| 6000/0000/00/0017/0015/000 | 71.34 |
| **එකතුව** | **422.30** |

## 2.5 විගණන නිරීක්ෂණය

------------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණු අතර, 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා නොතිබුණි.

### 3.2 විසර්ජන ගිණුම

------------------

#### 3.2.1 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

--------------------------------------------

2015 දෙසැම්බර් 31 දින වන විට ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනවලින් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා එකතුව රු.190,243 ක් වූ බැරකම්වලට එළඹී තිබුණි.

#### 3.2.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන

--------------------------------------------------------------------

වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

-----------------------------------------

මීටියාගොඩ මානම්පිටිය පාරේ බෝක්කුවක් සහ පැතිබැම්ම ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් රු.3,000,000 ක ප්‍රතිපාදන ගෝනපීනුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණි. කර්මාන්තයේ වටිනාකම ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සීමාව ඉක්මවා තිබූ නමුත්, ඒ සඳහා විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව එම කර්මාන්තය කොටස් තුනකට බෙදා ප්‍රජා පාදක සමිති දෙකක් වෙත කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ක්‍රියාත්මක කර තිබුණි. එම කර්මාන්තය නිම කිරීම සඳහා නියමිත දිනට වඩා වසරකට අධික කාලයක් ගත කර තිබුණි.

**(ආ) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව**

-----------------------------------------

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම සම්බන්ධයෙන් කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) පළාත් පාලන මහජන නියෝජිතයින් වෙත ලබාදෙන යතුරුපැදි ණය වැඩසටහන යටතේ ගාල්ල දිස්ත්‍රික් දිවිනැගුම කාර්යාලය විසින් නියෝජිතයින් 14 දෙනෙකු වෙත ලබාදී තිබුණු ණය මුදල්වලින් 2016 ජුලි 31 දින වනවිට රු. 425,712 ක් (පොලීය සමඟ) අයවීම් හිඟහිට තිබුණි.

(ii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ සේවය කළ අධ්‍යක්ෂකවරයකු හා නියෝජ්‍ය අධ්‍යක්ෂකවරයකු ගාල්ල දිස්ත්‍රික් දිවිනැගුම කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණි. එම නිලධාරීන් දෙදෙනාට විධිමත් පත්වීමේ ලිපි ලබාදී නොතිබුණි. එසේ තිබියදීත් 2014 ජුලි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දින දක්වා වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් එම නිලධාරීන්ට එකතුව රු.1,905,365 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි.

**(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශය**

-------------------------

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් පලතුරු ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් ලබාදී තිබුණු ප්‍රතිපාදන උපයොජනය කිරීම සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) එම ව්‍යාපෘතිය යටතේ රු.193,095 ක් වැයකර යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය කේන්ද්‍ර කර ගනිමින් වාණිජ අරමුණ පෙරදැරි කරගෙන ප්‍රතිලාභීන් 58 දෙනෙකුට දූරියන් පැල 1000 ක් බෙදාදී තිබුණි. එසේ බෙදාදුන් පැලවලින් සියයට 55 ක් පමණ පැල විනාශ වී තිබුණි.

(ii) යථෝක්ත ව්‍යාපෘතිය යටතේ හබරාදූව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රතිලාභීන් 155 දෙනෙකුට අන්නාසි පැල රු.100,000 ක් බෙදාදීමට අදාළ ව්‍යාපෘතිය සඳහා 2015 වර්ෂය අවසන් වනවිට රු.992,490 ක් වියදම් කර තිබුණි. එක් ග්‍රාම නිලධාරී වසමක් වෙත ලබාදී තිබූ පටක රෝපිත අන්නාසි පැල 7,000 ක් සම්පූර්ණයෙන්ම විනාශ වී තිබුණි.

**(ඇ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

-----------------------------------

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදී තිබුණු ප්‍රතිපාදනවලින් කොටසක් 2015 වර්ෂයේදී උපයෝජනය කර තිබුණි. එම උපයෝජනයන් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) බටපොල දිසා රෝහල සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2014 දෙසැම්බර් 22 දින කොන්ත්‍රාත්කරුට රු.1,363,328 ක් ද, 2014

දෙසැම්බර් 09 දින උපදේශන සේවා ගාස්තු ලෙස රු.60,929 ක් ද, 2014 දෙසැම්බර් 19 දින ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගයීම් කමිටු දීමනා ලෙස රු. 16,250 ක් ද වැය කර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණද, 2016 ජුලි 31 දින වන විටත් ව්‍යාපෘතියෙහි වැඩ ආරම්භ කර නොතිබුණු නමුත්, ගෙවන ලද අත්තිකාරම් මුදලද අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ii) අම්බලන්ගොඩ කහටපිටිය ක්‍රීඩාපිටිය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2014 දෙසැම්බර් 29 දින කොන්ත්‍රාත්කරුට රු.1,253,676 ක් ද, 2014 දෙසැම්බර් 09 දින උපදේශන සේවා ගාස්තු ලෙස රු. 56,019 ක් ද, 2014 දෙසැම්බර් 19 දින ප්‍රසම්පාදන හා තාක්ෂණ ඇගැයීම් කමිටු දීමනා ලෙස රු.16,250 ක් ද වැය කර තිබුණි. 2016 ජුලි 31 දින වනවිට මෙහි ගිවිසුම් කාලය ඉකුත් වී තිබුණු අතර ඉහත ගෙවීම් සිදුකර වසරකට වැඩි කාලයක් ගතවී තිබුණත්, ව්‍යාපෘතියේ වැඩ සියයට 20 ක ප්‍රමාණයට හෝ නිමකර නොතිබුණි.

(iii) ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 20 ක් වූ තවලම සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. ඉදිකිරීමට යෝජිත ඉඩමේ අයිතිය නිරවුල් කර නොගෙන හා කොන්ත්‍රාත්කරු වැඩ බිමට ප්‍රවේශවී නොතිබියදී, වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස රු.3,526,800 ක් 2014 දෙසැම්බර් 31 දින ගෙවා තිබුණි. ඉඩමේ අයිතිය නිරවුල් කර නොගැනීම හේතුවෙන් මෙම ව්‍යාපෘතිය අතහැර දැමීමට සිදුවී තිබුණු අතර, අත්තිකාරම් මුදල 2015 දෙසැම්බර් 07 දින ආපසු අයකර ගෙන තිබුණි. කෙසේ වුවද, වසරකට ආසන්න කාලයක් තිස්සේ රජයේ මුදල් බාහිර පාර්ශවයක් වෙත තබා ගැනීමට ඉඩහැර තිබුණි.

**3.3 අග්‍රිම ගිණුම**

-------------

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රු.194,086 ක අග්‍රිම ශේෂයක් 2006 වර්ෂයේ සිට පැවැත එමින් තිබුණත්, එය 2016 අප්‍රේල් 30 දින වන විටත් නිරවුල් කර නොතිබුණි.

**3.4 පොදු තැන්පත් ගිණුම**

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.මිලියන 124.91 ක් වූ තැන්පතු ශේෂ 236 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව තිබූ මාගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය වෙනුවෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු සඳහා 2009 වර්ෂයේදී ලැබී තිබුණු රු.526,326 ක් අදාළ කාර්ය සඳහා යොදවා නොගෙන පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

**3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---

විෂය අංක 26101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.මිලියන3.65 ක් වූ අතර, ඉන් රු.මිලියන 1.76 ක හිඟහිට ශේෂය 2016 ජූලි 31 දින වනවිටත් නිරවුල් කිරීමට අපොහොසත් වී තිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

---

ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 6 කට අයත් ප්‍රාදේශීය ලේකම් නිවාස 05 ක් හා සහකාර ප්‍රාදේශීය ලේකම් නිවාසයක් වසර 02 ක සිට වසර 16 ක් දක්වා කාල පරාසයක සිට ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දුරස්ථ අධ්‍යාපනික වැඩසටහන සඳහා මිලදී ගෙන තිබුණු රු.මිලියන 1.40 ක් වටිනා වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණික උපකරණ කට්ටලය වසර 2 කට වඩා වැඩි කාලයක් මුළුල්ලේ නිෂ්කාර්යව පැවතුණි.

**3.7 අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

ගිනි අවි ආඥා පනතේ 23(3) වගන්තිය හා 2013 සැප්තැම්බර් 18 දිනැති අංක MOD/CS/3F/2/2013 දරන රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව 2016 ජූනි 30 දින වන විට ගිනි අවි බලපත්‍රධාරීන් 96 දෙනෙකු විසින් බලපත්‍ර අලුත් කර නොතිබුණු අතර, එදිනට හිඟ බලපත්‍ර ගාස්තුවල එකතුව රු.161,300 ක් වී තිබුණි.

**3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම හා ඉටු කිරීමේ දුර්වලතා පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

**----------------------------------------**

තවලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර් 01 දින ආරම්භ කරන ලද ඇස්තමේන්තුගත වටිනාකම රු.450,000 ක් වූ තේ ශක්ති පාරේ සිට ආනන්ද මහතාගේ නිවස දෙසට වූ පාර කැපීම හා කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.77,669 ක් වැය කළ පසු අතහැර තිබුණි.

**(ආ) ප්‍රමිතියෙන් තොර වැඩ සඳහා ගෙවීම් කිරීම**

**-----------------------------------------------**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක ව්‍යාපෘති 02 කට අදාළ වැඩ විෂයයන් 02 ක් ඇස්තමේන්තුවල සඳහන් උපදෙස් අනුව සිදුකර නොතිබුණු නමුත්, ඒ වෙනුවෙන් රු.160,253 ක් ගෙවා තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටු කිරීමේ දුර්වලතාවයන්**

**---------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතා පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්කාර සමිතියේ මූල්‍ය හැකියාව සහ පළපුරුද්ද තහවුරු කර නොගෙන, එකී සමිතියට රු. 490,000 ක ඇස්තමේන්තුගත වටිනාකමක් යටතේ බඩහැලහේන මාර්ගය කාණු කපා කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්තුව භාරදී තිබුණි. වැඩ විෂය අංක 05 යටතේ නිසි ප්‍රමිතියෙන් තොරව මට්ටම් කර අතුරා තිබූ දිග මීටර් 5.79 ක කොටසක් සඳහා ඇස්තමේන්තු රේටයන් මත කිසිදු අඩු කිරීමකින් තොරව රු. 24,838 ක් ගෙවා තිබුණි.

(ii) නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද මහඅඹරවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 06 යටතේ ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් මිශ්‍රණයක් යොදාගෙන මාර්ගය කොන්ක්‍රීට් කිරීම හේතුවෙන් දිග මීටර් 50 ක කොන්ක්‍රීට් ස්ථරය ලිහෙන සුළු ස්වභාවයෙන් යුක්ත වී තිබුණි. එම කොටස සඳහා කොන්ක්‍රීට් ඝනමීටර් 14.81 ක් වෙනුවෙන් ඇස්තමේන්තුගත රේටයන් මත රු.208,303 ක් ගෙවා තිබුණි. ඇස්තමේන්තුව පරිදි මෙම මාර්ගයේ කොන්ක්‍රීට් ස්ථරයේ ඝනකම මීටර් 0.125 ක් තිබිය යුතු වුවත්, දිග මීටර් 91.3 ක කොටසක කොන්ක්‍රීට් ස්ථරයේ ඝනකම මීටර් 0.115 ක සිට මීටර් 0.120 ක් දක්වා පරාසයක අගයක් ගෙන තිබුණි. ඒ අනුව එහි ප්‍රමිතිය හා කල්පැවැත්ම දුර්වල තත්ත්වයක තිබුණි.

(iii) නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද වැල්ලගුලන කන්දපාර කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතියේ වැඩ විෂය අංක 06 යටතේ අනුමත ප්‍රමිතියෙන් තොර කොන්ක්‍රීට් මිශ්‍රණය යොදාගෙන මාර්ගයේ දිග අඩි 45 ක් තුළ අතුරා තිබූ කොන්ක්‍රීට් ස්ථරය, වැඩ නිම කර මාස 06 ක් ගතවීමටත් පෙර ගල් මතු වී අබලන් වෙමින් පැවතුණි. එසේ තිබියදීත් කොන්ක්‍රීට් ඝන මීටර් 4.18 ක් සඳහා ඇස්තමේන්තු රේටයන් අනුව කිසිඳු අඩුකිරීමකින් තොරව රු. 58,792 ක් ගෙවා තිබුණි.

(iv) නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද නෙළුව සමගි මාවත කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය පරීක්ෂාවේදී කොන්ක්‍රීට් ස්ථරයේ ඉවුර දෙපස තැනින් තැන කුහර මතුවී තිබූ අතර, එම පෘෂ්ඨය නියමිත ප්‍රමිතියට අනුව තලා මට්ටම් කර

නොතිබුණි. එසේ තිබියදීත් කිසිදු අඩුකිරීමකින් තොරව රු.588,000 ක් කොන්ත්‍රාත්කාර සමිතිය වෙත ගෙවා තිබුණි.

## 3.9 අවිධිමත් ගනුදෙනු

--------------------

නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වැල්ලගුලනකන්ද පාර කොන්ක්‍රීට් කිරීමේ ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත්කාර සමිතිය තෝරා ගැනීමේදී එහි මූල්‍ය හැකියාව තහවුරු කර ගැනීම සඳහා සමිතිය විසින් ඉදිරිපත් කර තිබූ ඉතුරුම් ගිණුම 2015 ඔක්තෝබර් 20 දින ආරම්භ කර තිබූ අතර එදිනට එහි ශේෂය රු.1,500 ක් වී තිබුණි. මෙම සමිතිය වෙත කොන්ත්‍රාත්තුව පැවරීමට පෙර පැවති මූල්‍ය ගනුදෙනු පිළිබඳ විස්තර ඉදිරිපත් කර නොතිබියදීත්, 2015 ඔක්තෝබර් 07 දින ගොවි සංවිධානය සමඟ රු.490,000 ක ගිවිසුමකට එළඹ කොන්ත්‍රාත්තුව පවරා තිබුණි.

## 3.10 පාඩු හා හානි

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ස්ථාපිත කර තිබූ විදුලි සෝපානයට 2014 සැප්තැම්බර් 15 දින සිදුවී තිබුණු හානියට අදාළ රු.213,370 ක අලාභය, පොත්වල සටහන් කර නොතිබුණි.

(ආ) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පවිත්‍රතා සේවාව ලබා ගැනීම සඳහා සේවා ආයතනයක් තෝරා ගැනීමේදී සේවකයකු ලබන අවම වැටුප හා වෙනත් කොන්දේසි සලකා බැලීමකින් තොරව මිල ගණන් සඳහා සාධාරණ අවස්ථාවක් ලබා නොදී අවම මිල ගණන් ඉදිරිපත් කරන ලද ආයතනය බැහැර කිරීම නිසා රජයට රු. 124,560 ක මූල්‍යමය පාඩුවක් සිදුවී තිබුණි.

(ඇ) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කර 2010 මැයි 30 දින මියගිය විශ්‍රාම වැටුප් ලාභියකු වෙත එදින සිට 2015 පෙබරවාරි මාසය දක්වා ගෙවා තිබූ විශ්‍රාම වැටුපෙන් රු.121,883 ක් අයවීමට තිබුණි. 2010 වර්ෂයෙන් පසුව ජීවත්වන බවට සහතිකයද ලබාදී නොතිබියදීත්, මෙම විශ්‍රාම වැටුප් ගෙවා තිබුණි.

(ඈ) නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රතිලාභීන්ට බෙදාදීම සඳහා ඇඳි රහිත ප්ලාස්ටික් පුටු 400 ක් මිලදී ගැනීමේදී අවම මිල ගණන් ඉදිරිපත් කර තිබූ මිල කැඳවීම බැහැර කිරීම නිසා රජයට රු.102,800 ක පාඩුවක් සිදු වී තිබුණි.

(ඉ) නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ සංවර්ධන නිලධාරිණියන් දෙදෙනෙකු වෙත ලබාදී තිබූ යතුරු පැදිවල රු.277,000 ක් වූ එකතු වටිනාකම ඔවුන් සේවයෙන් ඉවත් වී වසරක පමණ කාලයක් ගතවී තිබියදීත්, අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරියකු විසින් සිදුකර තිබූ රු.815,650 ක චෙක්පත් වංචාවට වසර ගණනාවක් ගතවී තිබුණත්, එම පාඩුව අයකර ගැනීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැවතුණි.

(උ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වාහනවලට සිදුවී තිබුණු අනතුරු සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 2 කට අයත් වාහන දෙකකට සිදුවී තිබුණු අනතුරු වලින් එකතුව රු. 137,336 ක අලාභ සිදුවී තිබුණත්, එම අලාභහානි සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීම ප්‍රමාද වී තිබුණි.

(ii) අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහනයකට අදාළ අනතුර සම්බන්ධයෙන් වූ නඩු තීන්දුව ලැබී වසර 05 කට අධික කාලයක් ගතවී තිබුණත්, දෙවැනි විත්තිකාරියගෙන් අයකරගත යුතු රු. 130,618 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අයකර ගෙන නොතිබුණි.

**3.11 විසඳා නොතිබුණු විගණන ජේද**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ජේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් නිවැරදි කර නොතිබුණු ජේද වලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ජේද අංකය** | |
| 2014 | 3.3 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් පරිපාලන නිලධාරී නිවස වසර 05 කට වැඩි කාලයක සිට බාහිර පාර්ශවයක් විසින් පරිහරණය කර තිබූ අතර, රු.148,800 ක් වූ නිවාස කුලියද අයකර ගෙන නොතිබුණි. |
| 2014 | 3.1 (අ) (ii) | මාර්ග කාපට් කිරීම සඳහා 2011 හා 2013 යන වර්ෂවලදී ශ්‍රී ලංකා ඉංජිනේරු සංස්ථාව වෙත ව්‍යාපෘති 27 ක් වෙනුවෙන් ලබාදී තිබූ රු.139,333,203 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල් 2015 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. |

**3.12 කළමනාකරණ දුර්වලතා**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් පරිදි කළමනාකරණ දුර්වලතා අනාවරණය විය.

**(අ) නියාගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**----------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පිටිගල ජලසම්පාදන යෝජනා ක්‍රමයේ අංක 01 ජල පොම්පාගාරය ඉදිකිරීම සඳහා පර්චස් 4 ක ඉඩම රජයට අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර වසර 02 කටත් වඩා වැඩි කාලයක් ගත වී තිබුණත්, ඉඩම අත්කර ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) ගම් පුළුල් කිරීමේ වැඩසටහන සඳහා අක්කර 32 පර්චස් 26 ක් වන ඩයමන්කන්ද සුද්දැල්ලැව මුකලාන ඉඩම, රජයට අත්කර ගැනීමේ කටයුතු ආරම්භ කර වසර 02 කටත් වඩා වැඩි කාලයක් ගත වී තිබුණත්, අදාළ පාර්ශවයන්ගේ පවතින අකාර්යක්ෂමතා හා සම්බන්ධීකරණ දෝෂ හේතුවෙන් ඉඩම අත්කර ගෙන එම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

(iii) ගම් පුළුල් කිරීමේ වැඩසටහන සඳහා අක්කර 05 පර්චස් 09 ක් වන මිරිස්වතුමුකලාන අංක 01 ඉඩම රජයට පවරාගෙන වසර 16ක් ගත වී තිබුණත්, එම වැඩසටහනට අදාළව කිසිදු ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) කරන්දෙණිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**----------------------------------------------**

ටී.ඩී.සමරවීර ක්‍රීඩාංගනය ඉදිකිරීම සඳහා යෝජනා කර තිබූ හෙක්ටයාර් 2.127 ක් වූ ඉඩම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානයේ හෙක්ටයාර් 0.285 ක් ලෙස දක්වා ඉඩම රජයට පවරා ගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ගයන් වසර 08 ක කාලයක් මුළුල්ලේ නැවතී තිබුණි.

**(ඇ) බෙන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**------------------------------------------**

මුද්දන්ගොඩ මානානවත්ත ඉඩමේ කොටසක් අත්කර ගැනීම සඳහා ලැබී තිබුණු රු.25,000 ක මුදල අදාළ අරමුණට යොදවා නොගෙන 1994 ජූලි 15 දින සිට ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි.

**(ඈ) නෙළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**---------------------------------------**

තවලම නෙළුව බටුවංගල මාර්ගයේ 9/5 පාලම ඉදිකිරීමට අදාළ ඉඩම රජයට අත්කර ගත් බව 2014 මැයි 09 දින ප්‍රසිද්ධ කර තිබුණත්, 2016 පෙබරවාරි මාසය වන විටත් අනෙකුත් ඉදිරි පියවරයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඉ) හික්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**-----------------------------------------**

පහත දැක්වෙන නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දොඩන්දූව පොදු වෙළඳපොල ඉදිකිරීම වෙනුවෙන් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය සඳහා හෙක්ටයාර් 0.1709 ක් වන මාදරමුල්ල කුඹුරුඹිවිට ඉඩම අත්කර ගැනීමේ කටයුතු 1999 වර්ෂයේ ආරම්භ කර ඉඩම අත්කර ගෙන තිබුණු නමුත්, එහි වන්දි ගෙවීම නැවතී තිබුණි. ඒ වෙනුවෙන් ලැබී තිබුණු රු.500,000 ක මුදල් පොදු තැන්පත්

ගිණුමේ රඳවා ගෙන තිබුණු අතර, වන්දි ගෙවීම ප්‍රමාදවීම නිසා ඒමත සැලකිය යුතු පොලී මුදලක්ද ගෙවීමට සිදුවන බව නිරීක්ෂණය විය.

(ii) ධීවර නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමේ අරමුණ පෙරදැරි කරගෙන ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය මඟින් 1995 වර්ෂයේදී හා 2000 වර්ෂයේදී රජයට පවරා ගත් පිළිවෙළින් හෙක්ටයාර් 0.243 ක් වන මෝදර පටුවත පිඹුරුදෙනිය ඉඩම හා හෙක්ටයාර් 0.3501 ක් වන උඩුමුල්ල මද්දුමගෙවත්ත ඉඩම අරමුණු ප්‍රකාරව කිසිදු සංවර්ධන කාර්යයක් සඳහා යොදවා ගෙන නොතිබුණි.

**(ඊ) යක්කලමුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය**

**----------------------------------------------**

2014 පළාත් නැගුම වැඩසටහන යටතේ කරාගොඩ ජම්බුගස්හේන මාර්ගය හා යටමලගල පහලවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් කොන්ත්‍රාත්කරුවෙකුට රු. 978,000 ක් ගෙවා තිබුණි. 2015 අගෝස්තු 31 දිනැති දිස්ත්‍රික් ඉංජිනේරු වාර්තාව අනුව එම මාර්ග දෙකෙහි සම්පීඩන ශක්තිය අනුමත සීමාවට වඩා අඩු අගයක් ගැනීම නිසා ව්‍යාපෘතිය අසමත් වී තිබුණද, ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

**3.13 මානව සම්පත් කළමනාකරණය**

**------------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**---------------------------------------------------------**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 65 | 58 | 07 | - |
| (ii) | තෘතීයික මට්ටම | 44 | 22 | 24 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 1,771 | 1,740 | 59 | 28 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 175 | 175 | 04 | 04 |
| | **එකතුව** | **2,055** | **1,995** | **94** | **34** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2016 ජුනි 30 දින වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් තනතුරු 01 ක, තෘතීයික මට්ටමට අයත් තනතුරු 17 ක, ද්විතීයික මට්ටමට අයත් තනතුරු 45 ක හා ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 04 ක පුරප්පාඩු පැවතුණි. එම පුරප්පාඩු විධිමත් පරිදි පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2016 ජුනි 30 දින වන විට තෘතීයික මට්ටමට අයත් තනතුරු 02 ක, ද්විතීයික මට්ටමට අයත් තනතුරු 28 ක හා ප්‍රාථමික මට්ටමට අයත් තනතුරු 02 ක අතිරික්තයක් පෙන්නුම් කරන අතර, එම සේවක සංඛ්‍යාව සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබුණි.